වාරය - දෙවන වාරය

| ශ්‍රේණිය : 08 | විෂයය : සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | පාඩම : සෞඛ්‍යවත් පාසල් පරිසරයක් ගොඩ නගමු. |
|---|---|---|

### ❖ සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු,

සෞඛ්‍යයට බලපාන සාධක තම පාලනයට ගැනීම මගින් තමාගේ සෞඛ්‍ය තත්වය දියුණු කර ගැනීමට පුද්ගලයන්ට හැකියාව ලබා දීමේ ක්‍රියාවලියකි.

### ❖ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු,

පාසල් දරුවන් හා පාසල් කාර්ය මණ්ඩලය ඇතුළු පාසල් ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පූර්ණ සංවිධාන ශක්තිය යොදවා ක්‍රියාත්මක වන පාසලකි.

### ❖ සෞඛ්‍යවත් පාසල් පරිසරයක තිබිය යුතු අංග

- භෞතික පරිසරය
- මානසික පරිසරය
- සමාජීය පරිසරය

### ❖ සෞඛ්‍ය ප්‍රවර්ධන උපාය මාර්ග



පෙළ පොතේ පාඩම ආශ්‍රයෙන් ප්‍රශ්න සියල්ලටම පිලිතුරු සපයන්න.

01. සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු කුමක්ද?

02. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය යනුවෙන් හැදින්වෙන්නේ කුමක්ද?

03. සෞඛ්‍යවත් පාසල් පරිසරයක තිබිය යුතු අංග මොනවාද?

04. යහපත් භෞතික පාසල් පරිසරයක පැවතිය යුතු අංග මොනවාද?

05. පාසලක පිරිසිදු වාතය පැවතීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

06. පාසල තුල පිරිසිදු භූමියක් පවත්වා ගැනීම සඳහා ශිෂ්‍යකු ලෙස ඔබට සහාය ලබාදිය හැකි ආකාරය ලියා දක්වන්න.

07. ඩෙංගු වැනි රෝගවලින් සුරක්ෂිත වීම සඳහා පාසල තුල ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් කීපයක් ලියා දක්වන්න.

08. මානසික හා සමාජීය යහපත් පාසල් පරිසරයක පැවැතිය යුතු අංග කිහිපයක් ලියා දක්වන්න.

09. කණ්ඩායම් ලෙස ක්‍රියාකාරකම්වල යෙදීම මගින් වර්ධනය කර ගත හැකි විවිධ කුසලතා මොනවාද?

10. ඔබේ පාසලේ මානසික හා සමාජීය පරිසරය යහපත් කිරීම සඳහා දියත් කර ඇති වැඩ සටහන් ලැයිස්තුවක් සකස් කරන්න. මීට අමතරව ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහන් යෝජනා කරන්න.

11. සෞඛ්‍ය ප්‍රවර්ධනයේ තේමා 05 ලියා දක්වන්න.

12. සෞඛ්‍යවත් ආහාර ලබා ගැනීම පිලිබඳව පාසල තුල ක්‍රියාත්මක කල හැකි ප්‍රතිපත්ති කීපයක් ලියා දක්වන්න.

13. පාසලට ගැළපෙන පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති කීපයක් ලියා දක්වන්න.

14. පුද්ගල නිපුණතා සහ දැනුම සංවර්ධනය සදහා පුද්ගලයකු තුල තිබිය යුතු නිපුණතා මොනවාද?

15. පහත සදහන් වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රජාවෙන් පාසලට කළ හැකි වැඩසටහන් | පාසලෙන් ප්‍රජාවට කළ හැකි වැඩසටහන් |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

16. සෞඛ්‍ය සේවා යනු මොනවාද?

17. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලට අවශ්‍ය විවිධ වැඩසටහන් මොනවාද?

18. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලට අවශ්‍ය සෞඛ්‍ය ආයතන මොනවාද?

19. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලට අවශ්‍ය සෞඛ්‍ය පුද්ගලයන් කවුරුන්ද?

20. සෞඛ්‍ය සේවාවලින් ලැබෙන ප්‍රයෝජන මොනවාද?

21. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ගොඩ නැංවීම සඳහා ශිෂ්‍යයෙකු ලෙස ඔබට ඉටු කළ හැකි යුතුකම් හා වගකීම් ලියන්න?

22. පාසල හා සම්බන්ධ ප්‍රජාව වන්නේ කවුරුන්ද?

23. පාසල අවට මත් ද්‍රව්‍ය විකිණීම වැළැක්වීම සදහා ප්‍රජාවට දායක විය හැක්කේ කෙසේද?

24. පාසල තුල ත්‍යාග, සහතිකපත්, ජය සම්මාන ආදියෙන් විශේෂ දක්ෂතා අගය කිරීම මගින් බලාපොරොත්තු වන්නාවූ අරමුණ පැහැදිලි කරන්න.

25. පාසල තුල උපදේශන පහසුකම් තිබීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.